# මීගමුව අධ්‍යාපන කලාපය

14-07-2016

## දෙවන වාර ඇගයීම - 2016

REFERENCE ONLY

**නර්තනය** | **9 ශ්‍රේණිය**

විභාග අංකය :.................................................... | කාලය පැය 02 යි

### I කොටස

* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

★ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. නව ග්‍රහයින් මුල්කරගෙන ගායනා කරනු ලබන කවි විශේෂය කි.
(1) සිරස පාද කවි. (2) ග්‍රහ පන්ති කවි.
(3) මල්යහන් කවි. (4) කඩතුරා කවි.

02. දඹදෙණි යුගයේ පැවති නර්තන කලාව පිළිබඳ සාධක දක්වෙන මූලාශ්‍ර දෙකක් වන්නේ,
(1) මහා වංශය සහ දීප වංශය ය.
(2) සැස්සේරුව සහ කොරවක්ගල ලෙන් ලිපි ය.
(3) දඹදෙණි අස්න සහ චූල වංශය ය.
(4) සද්ධර්මරත්නාවලිය සහ දඹදෙණි අස්න ය.

03. අංගහාර සරඹය යනු,
(1) තුන්වන ගොඩ සරඹයයි. (2) පස්වන ගොඩ සරඹයයි.
(3) හත්වන ගොඩ සරඹයයි. (4) අටවන ගොඩ සරඹයයි.

04. දෙබස් හා රංග වස්ත්‍රාභරණ අයත් වන්නේ,
(1) වාචික අභිනයට සහ ආහාර්ය අභිනයට ය. (2) වාචික අභිනයට සහ ආංගික අභිනයට ය.
(3) ආංගික අභිනයට සහ ආහාර්ය අභිනයට ය. (4) සාත්වික අභිනයට සහ වාචික අභිනයට ය.

05. "දෙං ජිං ජිං තකට දොංතක" මෙම බෙරපදය අයත් තාල රූපය වන්නේ,
(1) මාත්‍රා 3 තනි තිත ය. (2) මාත්‍රා 2 + 3 දෙතිත ය.
(3) මාත්‍රා 4 තනි තිත ය. (4) මාත්‍රා 3 + 4 දෙතිත ය.

06. අවකාශයේ භාවිත දිසා සහ තල ගණන පිළිවෙළින් මෙසේය,
(1) දිසා 8 සහ තල 3 කි. (2) දිසා 10 සහ තල 3 කි.
(3) දිසා 6 සහ තල 6 කි. (4) දිසා 12 සහ තල 3 කි.

07. කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ පුද ලබන දෙවිවරුන් වන්නේ,
(1) කොහොඹා දෙවි තුන් කට්ටුව සහ බණ්ඩාර දෙවි හත් කට්ටුව ය.
(2) කතරගම දෙවියන් සහ නාථ දෙවියන් ය.
(3) පත්තිනි දේවිය සහ දෙවොල් දෙවියන් ය.
(4) සමන් දෙවියන් සහ දෙවොල් දෙවියන් ය.

08. "ඉරහඳ පාන විල කොතැනද තුන්හිරියා......." මෙය,

(1) තාලම් කවිය කි. (2) කළගෙඩි කවිය කි.

(3) පන් නෙළීමේ කවිය කි. (4) කුලු කවිය කි.

09. "ගැටබෙර, පනාබෙර, එකැස් බෙර, මිහිඟු බෙර ............" ආදී ලෙස වාද්‍ය භාණ්ඩ නාම ලේඛනයක් සඳහන් ව ඇත්තේ,

(1) අනුරාධපුර යුගයට අයත් මහා වංශයේ ය. (2) පොළොන්නරු යුගයට අයත් දීප වංශයේ ය.

(3) යාපහුව යුගයට අයත් ථූප වංශයේ ය. (4) කුරුණෑගල යුගයට අයත් ථූප වංශයේ ය.

10. දවුල සහ තම්මැට්ටම සුදු පිරුවටවලින් වසා වැයී ම සිදුකරන්නේ,

(1) රණබෙර වාදනයේ දී ය. (2) මළබෙර වාදනයේ දී ය.

(3) වද බෙර වාදනයේ දී ය. (4) මඟුල් බෙර වාදනයේ දී ය.

(ලකුණු 1×10 = 10)

★ හිස්තැන් පුරවන්න.

11. "මිහිමඬලේ අඳුරු කුසේ .........." ගීතයට අනුව නර්තන නිර්මාණය කිරීමට උචිත චලන වන්නේ ...................... චලනයි.

12. මුරුගන් දෙවියන් සිහිපත් කිරීම සඳහා .................................. නටනු ලැබේ.

13. නර්තනය, චලනය මාධ්‍ය කොට ගන්නා අතර සංගීතය, ............................... මාධ්‍ය කොට ගනී.

14. දෙවොල් මඩු යාගය මුලින්ම පවත්වා ඇත්තේ .................................. රජුට වැළඳුන හිසරුදාව සුවපත් කිරීම සඳහා ය.

15. ...................................... ඇඳුම් කට්ටලය සබරගමු සම්ප්‍රදායට ආවේණික වේ.

(ලකුණු 1×5 = 5)

★ ප්‍රහේළිකාව පුරවන්න.

| | | | | |
|---|---|---|---|---|
| 1. | ත් | 2. | | |
| | ■ | | ■ | ■ |
| | ■ | රි | ■ | 4. |
| ■ | ■ | | ■ | ය |
| 3. | | | ■ | |

හරහට

16. 1 - ග්‍රහ පන්ති කවි ගායනයේ දී භාවිත කරන වාද්‍ය භාණ්ඩය කි.

17. 3 - මෙය එකැස් බෙරය නමින් ද හැඳින්වේ.

පහළට

18. 1 - කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ ඇතුළත් ගායනය සහිත නර්තන අංගය කි.

19. 2 - මණ්ඩියට සිටින විට දෙපා අතර තිබිය යුතු සම්මත දුර ප්‍රමාණය මෙසේ හඳුන්වයි.

20. 4 - ජීවන වෘත්තීන් හා බැඳි ගැමි නැටුමකි.

(ලකුණු 1×5 = 5)

## II කොටස

★ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

01. 1) "අභිනය" යන්න කෙටියෙන් හඳුන්වන්න.

2) සතර අභිනයන් නම් කර කෙටියෙන් විස්තර කරන්න.

3) ශාන්ති කර්මයක සතර අභිනය යොදා ගෙන ඇති අවස්ථාවක් ලියා කෙටියෙන් හඳුන්වන්න.

(ලකුණු $3+4+3=10$)

02. 1) දෙතිතේ ප්‍රභේද නම් කරන්න.

2) මාත්‍රා 3 තනි තිතට අයත් කවියක් ප්‍රස්තාර කරන්න.

3) මාත්‍රා 2 + 3 දෙතිතට අයත් කස්තිරමක් ප්‍රස්තාර කරන්න.

(ලකුණු $3+3+4=10$)

03. 1) දේශීය නර්තන සම්ප්‍රදායන්හි ප්‍රවීණයන් තිදෙනෙකු නම් කරන්න.

2) ඉන් එක් අයෙකු පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

3) ප්‍රවීණ ශිල්පීන්ගේ දායකත්වය නිසා නර්තන කලාවට සිදු වී ඇති සේවය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

(ලකුණු $3+3+4=10$)

04. 1) ද්‍රවිඩ ගැමි නැටුම් තුනක් නම් කරන්න.

2) ඉන් එක් නැටුමක් පිළිබඳ විස්තර කරන්න.

3) ද්‍රවිඩ ගැමි නැටුම් සහ සිංහල ගැමි නැටුම් වල දැකිය හැකි සමානතා සහ අසමානතා දෙක බැගින් ලියන්න.

(ලකුණු $3+3+4=10$)

05. 1) දඹදෙණි යුගයේ නර්තන කලාව පිළිබඳ සාධක දක්වෙන මූලාශ්‍ර දෙකක් නම් කරන්න.

2) එකල වාද්‍ය භාණ්ඩ භාවිත කළ බවට දක්වෙන සාධකයක් ලියා දක්වන්න.

3) මෙම යුගයේදී නර්තන කලාවට සේවයක් කළ රජතුමා නම් කර එතුමාගේ සේවය පිළිබඳ ඇගයීමක් කරන්න.

(ලකුණු $2+4+4=10$)